# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## ජාතිය ගොඩනැගීමේ බද්ද

### 2009 අංක 09 දරන ජාතිය ගොඩ නැගීමේ බදු පනත සඳහා කෙරෙන සංශෝධන

2011 වර්ෂය සඳහා වූ අයවැයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි, ජාතිය ගොඩ නැගීමේ බද්ද සඳහා සිදු කරන ලද පහත සඳහන් සංශෝධන, 2009 අංක 09 දරන ජාතිය ගොඩ නැගීමේ බදු පනතට විධිමත් සංශෝධන කිරීමට යටත්ව, 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන බව බදු ගෙවන්නන් වෙත දැනුම් දෙනු ලැබේ.

**01. ජාතිය ගොඩ නැගීමේ බදු අනුප්‍රමාණ අඩු කිරීම.**

ජාතිය ගොඩ නැගීමේ බදු අනුප්‍රමාණය 3% සිට 2% දක්වා අඩු කෙරේ.
(දේශීය වශයෙන් සපයා ගනු ලබන වී වලින් කරනු ලබන සහල් නිෂ්පාදනයෙන් සඳහා වූ පිරිවැටුම මත වූ 1.5% ක සහන අනුප්‍රමාණයද එකී දින සිටම, එනම් 2011.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 2% ක් වනු ඇත.)

**02. තොග සහ සිල්ලර වෙළඳාම සඳහා ජාතිය ගොඩ නැගීමේ බද්ද ව්‍යාප්ත කිරීම.**

පළාත් සභා විසින් පනවන ලද තොග සහ සිල්ලර වෙළඳාම මත පිරිවැටුම් බද්ද ඉවත් කිරීමට අනුව ජාතිය ගොඩ නැගීමේ බද්ද සම්බන්ධ විෂය පථය එකී තොග සහ සිල්ලර වෙළඳාමද ආවරණය වන පරිදි ව්‍යාප්ත කෙරේ. කෙසේ වෙතත්,

(අ) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ පනත යටතේ ගැනෙන ඕනෑම භාණ්ඩයක් එකී භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින්ම අලෙවි කිරීම, හෝ ඖෂධ අලෙවි කිරීම ජාතිය ගොඩ නැගීමේ බද්දට යටත් නොවේ. (ව්‍යතිරික්ත භාණ්ඩ උපලේඛනයේ අනෙකුත් භාණ්ඩ, තොග සහ සිල්ලර වෙළඳාම සම්බන්ධයෙන් නිදහස් භාණ්ඩ නොවේ.)

(ආ) තොග සහ සිල්ලර වෙළඳාමෙන් වූ බද්දට යටත් පිරිවැටුමෙන් 50% ක් අඩු කිරීමක් ලෙස බදු බැඳියාවෙන් ඉවත් කරනු ලැබේ.

**03. ජාතිය ගොඩ නැගීමේ බදු බැඳියාව අදාල වන සීමාව සංශෝධනය කිරීම.**

(අ) ජාතිය ගොඩ නැගීමේ බදු බැඳියාව සඳහා වූ පිරිවැටුම් සීමාව කාර්තුවක් සඳහා (රු.650,000/- සිට) **රු.500,000/-** දක්වා අඩු කෙරේ.

(ආ) කෙසේ වෙතත්, පහත සඳහන් ව්‍යාපාර කාණ්ඩ සම්බන්ධයෙන් ජාතිය ගොඩ නැගීමේ බදු බැඳියාව සඳහා වූ පිරිවැටුම් සීමාව කාර්තුවකට **රු.12,500,000/-** දක්වා වැඩි කෙරේ.

- (i) හෝටලයක්, ආගන්තුක නිවාසයක්, ආපන ශාලාවක් හෝ ඒ හා සමාන ව්‍යාපාර පවත්වාගෙන යාම ;
- (ii) දේශීයව අගය එකතු කළ කෘෂි නිෂ්පාදන සැකසීම, සහල් ආශ්‍රිත නිෂ්පාදන ;
- (iii) දේශීය අධ්‍යාපන ආයතනයන්හි සේවා ; සහ
- (iv) ශ්‍රම සැපයුම් (සේවකයින්) හෝ සේවා නියුක්තීන් සැපයීම.

**04. නිදහස් කිරීම් ඉවත් කිරීම.**

(අ) තරු තුනේ ශ්‍රේණියට ඉහළින් ශ්‍රේණි ගත කර ඇති හෝටල්වල සේවාවන් ජාතිය ගොඩ නැගීමේ බද්දට යටත් කර ඇත.

(ආ) වෛකල්පිත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තන් සඳහා ලබා දී තිබූ නිදහස් කිරීම ඉවත් කර ඇත.

**05. ව්‍යතිරික්ත භාණ්ඩ / සේවා උපලේඛනයට වූ එකතු කිරීම්.**

(අ) ව්‍යතිරික්ත භාණ්ඩ / ව්‍යතිරික්ත සේවා උපලේඛනයට පහත සඳහන් භාණ්ඩ සහ සේවාවන්ද ඇතුලත් කර තිබේ.

**ව්‍යතිරික්ත භාණ්ඩ -**

(i) විදේශ අරමුදල් හෝ පරිත්‍යාග මත රජය විසින් කරනු ලබන, ජාතික ආර්ථිකයේ යහපත සළකා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා කරනු ලබන (ආනයන ඇතුළුව) ඕනෑම භාණ්ඩ සැපයුමක්;

(ii) ආයුර්වේද ඖෂධ නිගන්ටුවට අයත් ආයුර්වේදීය සංයෝග හෝ ආයුර්වේදීය සංයෝග සඳහා අමු ද්‍රව්‍ය හෝ ඇසුරුම් ද්‍රව්‍ය, අදාල බලධාරියාගේ අනුමැතියට යටත්ව ආනයනය කිරීම ; සහ

(iii) - සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2714 යටතේ වූ තාර ; සහ

- ට්‍රැක්ටර්

ආනයනය හෝ සැපයීම.

**ව්‍යතිරික්ත සේවාවන් -**

(i) විදේශ අරමුදල් හෝ පරිත්‍යාග මත රජය විසින් කරනු ලබන ජාතික ආර්ථිකයේ යහපත සළකා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා කරනු ලබන ඕනෑම සේවා සැපයුමක් ;

(ii) ජාත්‍යන්තර ප්‍රවාහනයට අදාලව වරායන්ට හෝ ගුවන් සමාගම්වලට සපයනු ලබන සේවාවන් ;

(iii) විදේශීය වෙළඳපොලට නැව් නිපදවීම සම්බන්ධයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීම සඳහා කරනු ලබන සේවා ;

(iv) ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් උප කොන්ත්‍රාත්කරුවෙකුගේ සේවය ;

(v) විදුලි සංදේශ සේවා ; සහ

(vi) දේශීයව සකස් කළ පරිගණක මෘදුකාංග සැපයීම.

(ආ) රාජ්‍ය ආයතන (රජයේ දෙපාර්තමේන්තු ආදිය) සහ තවත් ආයතන කිහිපයක් ජාතිය ගොඩ නැගීමේ බද්දෙන් නිදහස් කර ඇත.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා පහත දුරකථන අංකයන්ට අමතන්න.**

ජාතිය ගොඩ නැගීමේ බදු අංශය - දුරකථන : 011-2338721, 011-3009245, 011-3009304
බදු සේවා අංශය - දුරකථන : 011-2328702, 011-3009040, 011-3009048
ලේකම් අංශය - දුරකථන : 011-2338543, 011-2338635
දේශීය ආදායම් වෙබ් අඩවිය - www.inlandrevenue.gov.lk

## දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

බදු - වඩා හොඳ අනාගතයකට